# සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පය ආශ්‍රිත සමාජානුයෝජන කාරකයක් ලෙස පවුලෙහි කාර්යභාරය පිළිබඳව විමර්ශනයක්

- ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි

හැඳින්වීම:- මිනිසා පිළිබඳ ශිෂ්ටාචාරයේ ප්‍රාථමික සමාජ සමූහය පවුල නමින් හැඳින්වේ. ස්ත්‍රියක හා පුරුෂයෙකු අතර සිදුවන විවාහයෙන් පවුලෙහි ආරම්භය සිදුවේ. ජීව විද්‍යාත්මක අවශ්‍යතාවක් වන ලිංගිකාශාව පවුලෙහි සම්භවය සඳහා පාදක වන අයුරු, පෙර අපර දෙදිග විවිධ දාර්ශනික සම්ප්‍රදායන්හි මෙන්ම, නූතන සමාජ විද්‍යාව හා මානව විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයන්හිත් විවරණය වේ. සමාජ සංස්ථාවක් ලෙසින් විකාශනයට ලක්වන පවුල් සංස්ථාව මිනිසා සතු ජීව විද්‍යාත්මක ලක්ෂණ මෙන් ම, සාංස්කෘතිමය ලක්ෂණ ද හේතු කොටගෙන වඩාත් පුළුල් ව විකාශනය වී ඇති බව පැහැදිලි ය.

සමාජ විද්‍යාඥයන්ගේ මෙන් ම මානව විද්‍යාඥයන් ගේ ද දැඩි අවධානයට පාත්‍ර වූ පවුල නම්වූ මූලික සමාජ සංස්ථාව විවාහය නැමති බැඳීමෙන් හෝ රුධිරමය බැඳීමෙන් හෝ උපකල්පනය කරන ලද බැඳීමකින් හෝ එක්වී එක් නිවසක වාසය කරන, සැමියා, බිරිඳ, මව, පියා, සොහොයුරා, සොහොයුරිය ආදී ලෙසින් තම තමන්ට ආවේණික තත්ත්වයන් යටතේ, අන්තර් ක්‍රියා හා අන්තර් සම්බන්ධතා පවත්වමින්, පොදු සංස්කෘතියක් නිර්මාණය කරන පුද්ගල සමූහයක් ලෙස අර්ථ සීමනය වේ. එහෙත් ලෝකයේ පවුල්වලින් 60% ක් පමණක් එක් නිවසක ජීවත්වන අතර ; සෙසු පවුල්වල අය, පියවරුන් මව්වරුන් හා දරුවන් වශයෙන් වෙන වෙනම වූ නිවෙස්වල ජීවත්වන බවද මෙහිදී වෙසෙසින් සඳහන් කළ යුතුය.[1] කෙසේ වෙතත් ස්ත්‍රී

පුරුෂයන්ගේ ලිංගික තෘප්තිය ඇතිකිරීම හා එහි ප්‍රතිඵලයක් ලෙස උපදින දරුවන් සමාජානුයෝජනය කිරීමෙහි ලා දායකවීම, මූලික අරමුණ කරගෙන පවුලක සම්භවය සිදුවේයැයි සිතීම යුක්ති යුක්ත ය.

දාර්ශනික චින්තන ධාරාවක් ලෙස මුල් බුදුසමය ද මිනිසා පිළිබඳවත්, ඔහු අයත්වන සමාජ සංදර්භය පිළිබඳවත් කෙරෙන විවරණයේ දී පවුල් සංස්ථාව වැදගත් සාධකයක් ලෙස හඳුනාගනියි. එසේ ම එහි ගැබ්ව පවත්නා සමාජානුයෝජන කාරක ගුණය ද අවධානයට ලක් කරයි. සමාජානුයෝජන කාරකයක් ලෙස පවුලෙහි කාර්ය භාරය පිළිබඳව මෙම අධ්‍යයනයෙන් විමර්ශනයට ලක් කෙරේ. සමාජානුයෝජනය යනු සමාජවිද්‍යාව විසින් හඳුන්වාදෙන ලද සංකල්පයක් ලෙස නූතනයේ පිළිගැනේ. එහෙත් මෙලොවට බිහිවෙන මිනිස් දරුවා සමාජගත කිරීමේ ක්‍රියාවලිය මිනිස් සමාජයේ ආරම්භය දක්වාම දිවෙන ක්‍රියාවලියක් බව පැහැදිලිය. ඒ අනුව මුල් බුදුසමය මිනිස් දරුවා සමාජගත කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ සමාජානුයෝජන ක්‍රියාවලිය මනාව හඳුනාගත් චින්තන ධාරාවක් බව එහි විවරණය වන සාධකයන්ගෙන් අනාවරණය වේ. විශේෂයෙන් බුදුදහමෙහි ආශ්‍රය ලබමින් පෝෂණය වූ බෞද්ධ සංස්කෘතියෙහි පහස ලැබූ සියලුම පෙරදිග රටවල්වල සමාජානුයෝජනය ක්‍රියාවලිය සම්බන්ධ පිළිවෙත් සමුදාය බටහිර රටවලටත් වඩා බෙහෙවින් ප්‍රතිජනනාත්මක වුවක් බව ප්‍රකට කරලීම මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයෙහි අරමුණ වේ.

## "පවුල" - බෞද්ධ අර්ථකථන විමර්ශනය

මුල් බුදුසමයෙහි "පවුල" යන සංකල්පය හැඳින්වීම සඳහා භාවිතයට ගෙන ඇත්තේ "කුල" යන යෙදුම ය.[2] විවිධ සූත්‍ර දේශනාවන්හි, "පවුල" යන අදහස දීම සඳහා "කුල" යන පදය භාවිතයට ගෙන ඇත. දරුවන් වෙතින් පුද සත්කාර ලබන පවුල් බ්‍රහ්මයා සහිත පවුල ලෙස හෙවත්, "සබ්‍රහ්මක කුල" නමින්ද, පූර්ව ආචාර්යවරුන් වන දෙමාපියන්ට ගරුකරන පවුල්"



සපුබ්බාචරියක කුල" නමින් ද, දෙමාපියන්ට පූර්ව දේවතාවන් ලෙස සලකන පවුල් "සපුබ්බදෙව කුල" ලෙසත් හැඳින් වේ.[3]

"සබ්‍රහ්මක කුල" යනු දෙමාපියන් සහිත පවුල ය. දෙමාපියෝ බ්‍රහ්ම නාමයෙන් හැඳින්වෙති.[4] දෙමාපියන් එනමින් හඳුන්වන්නේ, සිය දරුවන් කෙරෙහි උසස් ඇවතුම්, පැවතුම් සහිත වූවන් වන හෙයිනි. දරුවන් කෙරෙහි මෙත් සහගත සිතිවිලි පැතිරවීම (මෙත්තා); සිය දරුවන් දුකට පත්වූ විට අනුකම්පාවෙන් පිහිටවීම, (කරුණා), දරුවන්ගේ සැපතේ දී සතුටුවීම (මුදිතා), සිය දරුවන් කෙරෙහි මැදහත් සිතිවිලි සහිතවීම (උපෙක්ඛා) යන සතර බ්‍රහ්ම විහරණ සහිත දෙමාපියන් දරුවන්ගෙන් ගරු සම්මාන ලැබීමට සුදුසු ය. එවැනි පවුල "සබ්‍රහ්මක කුල" ලෙසින් හැඳින්වේ. මේ මගින් ප්‍රකට වනුයේ බුදු සමය දාරක කේන්ද්‍රීය පවුලක් පිළිබඳව වූ සංකල්පයක් ඉදිරිපත් කරන බව ය.[5]

පූර්වාචාර්යවරුන් සහිත පවුල (සපුබ්බාචරියක කුල) නමින් හැඳින්වෙන්නේ දරුවන්ගේ මුල් ම ගුරුවරුන් සහිත පවුල ය. පූර්ව ආචාර්යවරුන් යනු දෙමාපියන් ම ය.[6] දරුවන්ට සිය ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කුසලතා ලබාදෙන මුල් ම ගුරුවරුන් වන්නේ දෙමාපියන් ය. ආහාරපාන, රැකවරණ, වත් පිළිවෙත්, යැම් ඊම්, ඉඳුම් හිටුම් ආදිය පිළිබඳ ව පිළිවෙත් වැනි දෑ ද උගන්වනු ලබනුයේ දෙමාපියන් විසිනි. එවැනි දෙමාපියන් සහිත පවුල "සපුබ්බාචරියක කුල" නම් වේ.

පූර්ව දේවතාවන් සහිත පවුල "සපුබ්බදෙව කුල" නම් වේ. පූර්ව දේවතාවන් වන්නේ ද දෙමාපියන් ය. දෙවියන් යනු ආරක්ෂාව සලසන්නවුන් ය. එනිසා ඔවුන් "පුබ්බදෙව" නමින් හැඳින් වේ.[7]

"පවුල" පිළිබඳ මෙම අර්ථ විමර්ශනයන්ගෙන් අනාවරණය වන්නේ පවුලෙහි කාර්යභාරය කෙබඳු වන්නේ ද යන්න යි. දරුවන්ට සෙනෙහස දැක්වීම; ආරක්ෂාව සැලසීම දෙමාපිය කාර්ය භාරය වේ. එසේ ම පවුල නම් වූ ආයතනය මව, පියා හා

දරුවන්ගෙන් සමන්විත වූ ඒකකයක් ලෙස හඳුනාගැනීම ද වැදගත් සාධකයකි.

## පවුල් සංස්ථාවෙහි සම්භවය

ආදි කාලීන සත්ත්වයන් ජීවත් වූයේ ස්වභාව ධර්මයෙහි පිහිටෙන් ය. ඔවුහු කිසි ම උපකරණයක් භාවිත නොකළ හිස් අත් ඇත්තෝ වූහ. ඇස, කණ, ආදී ඉන්ද්‍රියන් මගින් පරිසරය සමග අන්තර්ක්‍රියා පැවැත් වූ ඔවුන් ආහාර වශයෙන් ගත්තේ පෘථිවි රසය (පඨවිරසාය) යි.[8] පෘථිවිගත සත්ත්වයාගේ මෙම කාල වකවානුව නියෝජනය කරනුයේ ස්වභාවික පර්යාය යි. එසේ ම එම යුගය ඔවුන් ස්වභාව ධර්මය ආශ්‍රිත ව බිහි වූ ආහාර අනුභවයෙන් ජීවිතය පවත්වාගෙන ගිය ආහාර ගවේෂණ යුගය ලෙස හැඳින්වීම උචිත ය. මේ අනුව ආදි කාලීන සත්ත්වයා ස්වභාව ධර්මයේ ඵලය වූ අල වර්ග, මුල් වර්ග, හතු වර්ග, පළතුරු වර්ග ආහාරයට ගත් බව පැහැදිලි ය.[9] මෙලෙස මුල් බුදුසමය ද සමාජය ප්‍රභවය පිළිබඳ විවරණය තුළින් ආදි කාලීන සත්ත්වයා ස්වභාවික පර්යාය තුළ ජීවත් වූ ආකාරය ප්‍රකට කරයි.

මේ අනුව ස්වභාවික පර්යාය තුළ ජීවත් වන සත්ත්වයා තමන්හට අවශ්‍ය ආහාර නිෂ්පාදනය නො කරයි. පරිභෝජනය සඳහා ඔහු යොදාගත්තේ ස්වභාව ධර්මයට අයත් ශාකයන් බව අග්ගඤ්ඤ සූත්‍රයෙහි දැක් වේ. ඔවුනගේ ප්‍රථම ස්වභාවික ආහාර විශේෂය වූයේ පෘථිවි රසය (පඨවිරසාය) යි. අනතුරුව 'භූමිප්පටක' ලෙසින් හැඳින්වුණ හතු විශේෂයක් ඔවුනගේ ආහාරය බවට පත්විය.[10] ආහාර ගවේෂණ යුගයේ ඔවුනගේ ඊළඟ ආහාරය ලෙස දැක්වෙන්නේ 'බදාලතා' නම් වූ වැල් විශේෂයකි.[11] මේ අන්දමින් දිගු කාලීන ආහාර ගවේෂණ යුගය තුළ සත්ත්වයන් අතර, විශේෂ බෙදීමක් හෝ ස්ථරායනයක් නොවීය. ඔවුනතර සම්පත් උරුමය පිළිබඳ ගැටුමක් ද විද්‍යමාන නොවීය. ස්වභාවික පර්යාය තුළ ජීවත් වූ මොවුහු කායික හා මානසික වශයෙන් සමාන වූහ. ප්‍රීතිමත් ජීවිතයක් ගෙවූ ඔවුන් තුළ අතෘප්තිකර තෘෂ්ණාවක් ද ප්‍රකට නොවූ බව පෙනේ.



ආහාර ගවේෂණ යුගයෙහි ඒ ඒ අවස්ථාවන්හිදී සත්ත්වයන් අතර විවිධ විෂමතා ප්‍රකට වන්නට විය. ආහාර පරිභෝජනයෙහි ප්‍රතිඵල වශයෙන් ඔවුනතර ශාරීරික වර්ණයෙහි විෂමතා පළවන්නට විය. මේ හේතුව නිසා වර්ණවත් ශරීර ඇති හා දුර්වර්ණ ශරීර ඇති අය වශයෙන් විභේදනයක් ප්‍රකට වන්නට විය. මේ හේතු කොටගෙන වර්ණවත් අය තුළ තමන් වර්ණවත් වූ හෙයින් මානය ආදී අයහපත් සිතුවිලි ජනිතවීම ද විශේෂයකි.[12]

සත්ත්වයා තුළ තෘෂ්ණාව (තණ්හා) හා අනුකරණය (දිට්ඨානුගති) වැනි මානව ගති ලක්ෂණ අනුක්‍රමයෙන් පහළ වන්නට වූයේ ද ස්වභාව ධර්මයෙහි ආහාර පරිභෝජනයත් සමඟ ම වීම විශේෂයකි.[13] මෙම සත්ත්වයන් තුළ සුඛ වින්දනය කෙරෙහි යොමුවීමෙහි මානව ස්වභාවය ද ස්වභාව ධර්මය ආශ්‍රිත ව දිවි ගෙවූ මුල් යුගයෙහි ම විද්‍යමාන වීම ද වැදගත් ලක්ෂණයකි.

දිගු කාලීන ආහාර ගවේෂණ යුගයෙහි සත්ත්වයෝ සත්ත්වයන් ම වූහ. මෙම යුගයේදී ස්ත්‍රී පුරුෂ වශයෙන්[14] හෝ මානව නාමයෙන් හෝ ඔවුන් හැඳින් වූ බවක් නොපෙනේ. එහෙත් දිගුකාලීන ව ස්වභාව ධර්මයෙහි ආහාර පරිභෝජනයට ගැනීම නිසා සත්ත්වයින් තුළ විවිධ කායික මානසික විපර්යාසයන් සිදුවිය. ආහාර ගවේෂණ යුගයෙහි අවසාන භාගයෙහි සත්ත්වයා ස්ත්‍රී පුරුෂ වශයෙන් ප්‍රභේදකරණයට ලක් වූ අයුරු අග්ගඤ්ඤ සූත්‍රයෙහි විවරණය වේ. එහිදී ස්ත්‍රියට ස්ත්‍රී ලිංගය ද, පුරුෂයාට පුරුෂ ලිංගය ද පහළ වේ. ස්ත්‍රිය පුරුෂයා පිළිබඳවත්, පුරුෂයා ස්ත්‍රිය පිළිබඳවත් දිගු වේලාවක් අවධානය යොමු කිරීමෙහි ප්‍රතිඵලය වූයේ ඔවුන් තුළ රාගය පහළවීමය. රාගය නිසා ශාරීරික ව දැවීමක් ඇතිවිය. මේ ක්‍රියාවන් සියල්ලෙහි අවසානය වූයේ ස්ත්‍රී පුරුෂ සම්භෝගය සිදුවීම යි.[15] මෙම සිදුවීම් මාලාවෙහි විශේෂත්වය වන්නේ එනම් ඔවුනොවුන් අතර වූ සත්ත්ව සංඥාව බැහැර වී තමන්ගෙන් පරිබාහිර වූ පුද්ගලයා "අඤ්ඤ" හෙවත් වෙනත් අයකු සේ හඳුනාගැනීම යි. මෙම හැඟීම් ජනිත වීම ලිංගිකාශාව සහිත පුද්ගලයෙකු තුළ පළමුවෙන් ම ජනිත වන ලක්ෂණයක් සේ ගත හැකිය.[16] සැබැවින්

ම ලිංගික සම්භෝගය සඳහා තමන් හා අන් අයෙකු, විශේෂයෙන් විරුද්ධ ලිංගිකයකු අවශ්‍ය වේ. මේ අනුව පැහැදිලි වන්නේ මෙම මානසික ස්වභාවය හේතු කොටගෙන දාහය හෙවත් ලිංගිකාශාව හටගැනීම නිසා ලිංගික හැසිරීම සිදුවූ බව ය. මෙලෙස තමන් හා අනෙකෙකු පිළිබඳ වූ හඳුනාගැනීම හෙවත්, ස්ත්‍රී-පුරුෂ ප්‍රභේදකරණය මිනිසා පිළිබඳ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සළකුණු කරයි.

සත්ත්වයා සත්ත්වයා ලෙස හැඳින්වීමේ ප්‍රවණතාව වෙනස් කරමින් ස්වභාවික පර්යාය තුළ ජීවත් වූ සත්ත්වයා සාංස්කෘතික පර්යායට එක්වීමේ සුවිශේෂී අවස්ථාව සනිටුහන් කෙරෙනුයේ පවුල් සංස්ථාව බිහිවීමෙනි. සත්ත්වයා ලිංගිකත්වයට යොමුවීම; පවුලෙහි සම්භවය හා බැඳුනු වැදගත් සාධකයකි. එසේ ම එම අවස්ථාව සපුරා ම ඓතිහාසිකමය හා සාංස්කෘතිකමය නිර්මාණයකි. මේ පිළිබඳ විවරණයක යෙදෙන ෆුකෝ *(Foucault: 1986)* ලිංගිකත්වය යනු මිනිස් ශරීරයේ සුවිශේෂී අංගයක් වෙන්කොට හඳුනාගැනීමක් ලෙසත්, එලෙස හඳුනාගැනීමේ දී ඔහුට අනෙක් සත්ත්වයා දර්ශනය වන්නේ විරුද්ධ ලිංගිකයෙකු ලෙස බවත් පවසයි.[17]

ස්ත්‍රිය පුරුෂයාගේ ලිංගිකත්වය පිළිබඳ වස්තුව වන අතර, පුරුෂයා ස්ත්‍රියගේ ලිංගිකත්වය පිළිබඳ වස්තුව බවට පත්වේ. ඔවුනොවුන්ගේ පැවැත්ම කෙරෙහි ස්ත්‍රිය හා පුරුෂයා අන්‍යොන්‍ය වශයෙන් බලපායි. මේ අනුව පවුලේ ආරම්භයට බලපෑ මුඛ්‍යතම සාධකය ලිංගිකාශාව තෘප්ත කරගැනීමෙහි අවශ්‍යතාව බවට මුල් බුදුසමය ප්‍රකට කරන විග්‍රහය වඩාත් තහවුරු වේ. ජීව විද්‍යාත්මක අවශ්‍යතාවක් වන ලිංගිකාශාව තෘප්ත කරගැනීම සඳහා දරණ ප්‍රයත්නය සමාජය විසින් හෙළා දුටුයේ කෙනෙක් තවත් කෙනෙකුට මෙවැන්නක් කරන්නේ කෙසේදැයි කියා ප්‍රශ්න කරමිනි.[18] මෙසේ හෙළා දුටුයේ මිනිසුන් තුළ පවත්නා ලැජ්ජා භය නිසා බව පැහැදිලි ය. එහෙත් මෙම යොමුවීම මිනිසා පිළිබඳ සාංස්කෘතික පර්යායෙහි නව යුගයක ආරම්භයක් විය. ලිංගිකව හැසිරෙනු කැමති උදවිය පෙරකී පරිදි අන්‍යන්ගේ බාධා කිරීම වලින් තොරව, එහි නියැලෙනු සඳහා



ගෘහ වාසය ආරම්භ කළහ.[19] ගෘහවාසිව ලිංගික සබඳතා පැවැත්වීමේ අවශ්‍යතාව ප්‍රකට නොවන තාක් ගෘහ වාසයෙහි අවශ්‍යතාව ද ප්‍රකට නොවීය. එම අවශ්‍යතාවත් සමඟ ම මිනිසා නිර්මාණය කරගත් ගෘහය ආශ්‍රිත ව පවුලෙහි සම්භවය සිදුවූ අයුරු මුල් බුදුසමය පැහැදිලි ව විවරණය කරයි.

පවුලෙහි සම්භවයත් සමග ම සාංස්කෘතික සත්ත්වයෙකු බිහිවනවාය යන්න සමාජ හා මානව විද්‍යාඥයන්ගේ අදහස වේ.[20] පවුලෙහි ස්ථාවර පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය නිෂ්පාදන ක්‍රියාවලියෙහි ආරම්භය සිදුවන්නේ ද පවුලෙහි සම්භවය නිසා ය. එදිනෙදා ආහාර සොයාගෙන ජීවත් වූ මිනිසාට විවාහයත් සමඟ ම නිෂ්පාදනයට පෙළඹීමට සිදුවන්නේ පරිභෝජනය සඳහා තවත් සාමාජිකයන් එක්වීම සිදුවන හෙයිනි. මෙතෙක් කලක් ස්වභාව ධර්මයෙහි ආහාර පරිභෝජනය කළත් නිෂ්පාදනය සඳහා යොමුවීම නිසා ඔහු සාංස්කෘතික පර්යායට එකතු වේ. සාංස්කෘතික පර්යායෙහි මූලික ලක්ෂණයක් වන්නේ පුද්ගලයා නිෂ්පාදන ක්‍රියාවලියට යොමුවීම ය.

## පවුලෙහි කාර්ය භාරය

පවුල නම් වූ සමාජ ඒකකය පාදක ව බිහිවන වැදගත් ම සම්බන්ධතාව වන්නේ මවුපිය - දූ දරු සම්බන්ධතාව යි. මවුපියන් හා දූ දරුවන් අතර පැවැතිය යුතු යහපත් සබඳතා පිළිබඳ ව මුල් බුදුසමයෙහි කරුණු විවරණය වේ. මාතෘත්වය හා පිතෘත්වය කෙරෙහි දරුවන් තුළත්, දාරකත්වය කෙරෙහි මව්පියන් තුළත් පැවැතිය යුතු යහපත් සබඳතාව පාදක ව සාර්ථක සමාජානුයෝජනය ක්‍රියාවලියක ආරම්භය සිදුවන බව පැහැදිලි ය.

නූතන සමාජ විද්‍යාඥයින් ද පවුලෙහි ප්‍රධාන කාර්ය භාරය කවරේදැයි සිය අවධානය යොමු කරන්නේ එහි ඇති ප්‍රායෝගික වැදගත්කම නිසා ය. ඒ අතර පහත සඳහන් අරමුණු පවුලෙහි කාර්ය භාරය විශද කරවන සාධක සහිත ප්‍රශස්ත නිර්වචනයක් ලෙස ඇගයීමට ලක් වේ.[21]

බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
07 FEB 2014

1. ලිංගික කෘත්‍යය
2. ප්‍රජනන කෘත්‍යය
3. ආර්ථික කෘත්‍යය
4. අධ්‍යාපන කෘත්‍යය
5. පොදු වාසය

නූතන සමාජ විද්‍යාඥයන් විසින් පවුලෙහි කාර්ය භාරය පිළිබඳ ව දක්වනු ලබන මෙවැනි අදහස් සැබවින් ම බුදුසමයෙහි දැක්වෙන අදහස්වල විකාශනයක් ලෙස ගත හැකිය. පවුලෙහි කාර්යභාරය පිළිබඳ ව බුදුසමයෙහි දැක්වෙන අදහස් නූතන අදහස්වලට වඩා සාධනීය ස්වභාවයක් ප්‍රකට කරන බව ද පැහැදිලි ය.

මිනිස් දරුවා උපත ලබනුයේ පවුල නම් වූ සමාජ ඒකකයෙහි ය. ඒ අනුව මව්පිය දූදරු සබඳතාව පවුල තුළ වැදගත් වූ සාධකය වේ. මුල් බුදුසමය මෙම සම්බන්ධතාව වඩාත් අර්ථවත් එකක් වියයුතු බව හඳුනාගනියි. එසේ විය යුත්තේ, එය යහපත් සමාජානුයෝජනමය ක්‍රියාවලියකට අවශ්‍ය පදනම සලසන හෙයිනි. ජෛවීය සත්වයෙකු ලෙස උපත ලබන දරුවා සමාජයීය සත්වයෙකු බවට පත්කරලීමේ වැදගත් කාර්යභාරය පැවැරෙන්නේ පවුල් සංස්ථාව වෙත වන නිසාත් ය. එනිසා දරුවාට පවුලේ දෙමාපිය හා වැඩිහිටි ඇසුර අත්‍යවශ්‍ය සාධකයක් සේ සැලකේ. මව්පියෝ දරුවනට බෙහෙවින් උපකාරී වෙති. (බහුකාරා) දරුවන් ඇති දැඩි කරති (ආපාදකා), පෝෂණය කරති (පොසකා). සමාජය පිළිබඳ ඔවුන්ට අවබෝධය ලබා දෙති (ඉමස්ස ලොකස්ස දස්සෙතාරො)[22]

මෙම විවරණයෙහි ආපාදකා යනු දරුවා තුළ පවත්නා කායික මානසික කුසලතා වර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේ. එමගින් දරුවන් සමාජයට අදාළ ලෙස සමාජගත කිරීමේ කාර්යයෙහි දෙමාපියන් නිරත විය යුතු බව අදහස් කෙරේ. දරුවා සතු කුසලතා හැකියාවන් දැන හැඳිනගෙන පුද්ගල හා සමාජ යහපැවැත්ම උදෙසා දරුවනට උපකාරී වීම මෙයින් ප්‍රකට

07 FEB 2014



කෙරෙන අදහසයි. මෙලොවට බිහි වූ මිනිස් දරුවාගේ ජීවිතය සුරක්ෂිත වන්නේ අන් අයගේ ආරක්ෂාව මතය. මේ අනුව මිහිතලයේ නිවසන අන් සත්ත්වයන්ට වඩා දීර්ඝ ළමා කාලයක් ගත කරන මිනිස් දරුවා අනතුරකට ලක් නොවන අයුරින් රැකබලා ගැනීම, හදාවඩා ගැනීම "ආපාදකා" ලෙසින් අර්ථවත් වේ. දෙමපියන් විසින් දරුවන් නිසි මග මෙහෙයවමින් ඔවුන්ගේ ජීවිතය යහපත් අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා ලබාදීම "ආපාදකා" ලෙසින් දැක්වේ. මෙලෙස දරුවා තමාම රැකෙන්නට සමත්වන තුරු ඔහුව රැකබලා ගැනීම මෙන්ම අනතුරුව ඔහුගේ ජීවිතය පිළිබඳ වගකීම ඔහු වෙතම පවරා දීමේ ක්‍රියාවලිය ද මේ තුළ ගැබ්ව පවතී. මෙලොවට බිහි වූ දරුවාගේ ජීවිතය සුරක්ෂිත වන්නේ අන් අයගේ ආරක්ෂාව මත ය. මේ අනුව මිහිතලයේ නිවසන අන් සත්ත්වයන්ට වඩා දීර්ඝ ළමා කාලයක් ගතකරන මිනිස් දරුවා අනතුරකට ලක් නොවන අයුරින්, රැක බලා ගැනීම, හදාවඩා ගැනීම, 'ආපාදකා' ලෙසින් අර්ථවත් වේ. තම දරුවන් නිසි මග මෙහෙයවමින්, ඔවුන්ගේ ජීවිතය පවත්වාගෙන යාම සඳහා, අවශ්‍ය වැටහීම ලබාදීම (ආපාදකාති අනුපාලකා) ද මෙයින් දැක් වේ.[23] දරුවා නිසි මග මෙහෙය වීම යනු විධිමත් අධ්‍යාපනය ලැබීමට පෙර, ලැබිය යුතු ව්‍යවහාරික කුසලතා ඇතිකරලීම ය.[24] එසේ ම දරුවා තමා වෙත පැමිණෙන උවදුර හඳුනා ගැනීමට අසමත් වේ. එනිසා තමා ම රැකෙන්නට සමත්වන තුරු දරුවා ආරක්ෂා කිරීමට දෙමාපියන් බැඳී සිටින බව ද 'ආපාදකා' ලෙස අර්ථ සීමනය වේ.[25]

පෝසකා යනු දරුවා පෝෂණය කිරීමේ කාර්යයි. එම පෝෂණය කායික හා මානසික පෝෂණය වශයෙන් දෙයාකාර වේ. මවුකුස තුළ දරුවකු පිළිසිඳගත් පසු එම දරු ගැබ නව මසක් හෝ දස මසක් හෝ දරා සිට මෙලොවට බිහි කොට සිය ලෝහිතය කිරි බවට පත්කර පෝෂණය කරයි. ලෝහිතය යනු මවු කිරියි.[26] සමස්ත සත්ත්ව වර්ගයම පෝෂණය සිය ජීවන පැවැත්ම කොට පවතී. ආහාර යන්නෙහි සම්පාර්ථය වන්නේ ද පැවැත්ම යන්නයි.[27] මෙලෙස මිනිස් සංහතියේ

පැවැත්ම උදෙසා අවශ්‍ය වන ආහාර වර්ග පිළිබඳව මුල් බුදු සමයෙහි දැක්වේ.[28]

1. ඝන ද්‍රව ආහාර (කබලිංකාරාහාර)
2. ස්පර්ශය (ඵස්සාහාර)
3. සිතිවිලි (මනෝසංචේතනාහාර)
4. අරමුණු පිළිබඳ අවදිබව (විඤ්ඤාණාහාර)

මේ ආහාර මගින් ප්‍රකට කෙරෙනුයේ මිනිස් දරුවෙකුගේ පෝෂණය යනු කායික හා මානසික දෙඅංශයෙන්ම සිදුවිය යුත්තක් බවයි. කබලිංකාරාහාර මගින් ශාරීරික පැවැත්ම කෙරෙහි අවශ්‍ය ශක්තිය ජනනය කෙරේ. පුද්ගල පෞරුෂය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සෙසු ආහාර උපකාරී වේ. මෙලෙස කායික හා මානසික වශයෙන් දෙමාපියන් ලබා දෙන පෝෂණය මිනිස් දරුවා යහපැවැත්මක් සහිතව සමාජගත කිරීමට ඉවහල් වේ. නිරෝගී කායික හා මානසික පෝෂණය සහිත මිනිස් දරුවා සමාජානුයෝජනය පිළිබඳ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ද වේ. මෙසේ පෝෂණය ලබන දරුවා ශාරීරික ව වර්ධනය (වුද්ධි මඣාය) වන අතර; ක්‍රමයෙන් ඔහුගේ ඉන්ද්‍රිය වර්ධනය (ඉන්ද්‍රිය පරිපාක මඣාය) ද සිදුවේ.[29] ශාරීරික වර්ධනය යනු පෝෂණීය ගුණයෙන් යුත් ආහාර මගින් ශරීරය වැඩීම යි. ඉන්ද්‍රිය පරිපාකය යනු ශාරීරික වර්ධනය නො වේ. පසිඳුරන් රූපාදී අරමුණු හා ගැටී එම ස්වභාවයන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යි. මෙම ක්‍රියාවලිය මානසික පෝෂණය හා සම්බන්ධ වේ.

දරුවාට තමා අයත් ලෝකය හෙවත් සමාජය හඳුන්වාදීමේ කාර්යය (ඉමස්ස ලෝකස්ස දස්සෙතාරො) ඉටුකිරීම ද දෙමාපියන්ට අයත් වූවකි. සමාජය හඳුන්වාදීම යනු ලෝකයේ පවත්නා යහපත් - අයහපත්; රුචි අරුචි ස්වභාවයන් හඳුන්වාදීම ය. මවුපියන් දරුවකු උපන් දිනයේ ම දෙපයින් ගෙන කැළයට හෝ ගඟට දමන්නේ නම්, ලොව යහපත් අයහපත් ස්වභාවයන් හඳුනා ගැනීමට නොලැබේ. එසේ නොකර දරුවා හදා වඩමින්, පෝෂණය කරමින්, කටයුතු කරන හෙයින් ලෝකයේ දුක සැප



යනාදී ස්වභාවයන් දෙමාපියන් වෙතින් උගනියි.[30] දරුවන්ට මේ ලෝකය හඳුන්වා දෙන උදවිය ලෙස මවුපියන් සැලකෙන්නේ මේ නිසා ය. මෙම කාර්යභාරය දෙමාපියන් සිය දරුවන් සමාජයට උචිත පරිදි අනුයෝජනය කිරීමේ කාර්ය ම බව පැහැදිලි ය. දාරක සමාජානුයෝජනයේ දී දෙමාපිය වගකීම කෙසේ වන්නේ දැයි ප්‍රකට කිරීමට මෙය ප්‍රබල සාධකයකි. මවුපියන් දරුවන් ඇති දැඩි කළයුත්තේ, මෙම සමාජානුයෝජනය කාර්යය පිළිබඳ ව මනා වැටහීමක් ඇතිව ය. මේ අනුව දාරක සමාජානුයෝජනය කෙරෙහි ද දෙමාපිය ආදරය, සෙනෙහසෙහි ප්‍රමාණය බලපානු ලබයි. දරුවාගේ ජීවිතය විධිමත් කිරීමට නිරෝගී මානසික තත්ත්වයක් ඇතිකිරීමට සෙනෙහස අත්‍යවශ්‍ය වේ.[31] "ජනෙත්ති" යන නාමය මවට හිමිවන්නේ ඇය සිය කුස පිළිසිඳ ගත් දරුවාට නිරෝගී උපතක් ලබාදෙන හෙයිනි.[32] තන කිරි දී, ගී ගයා, නළවා, ශරීර ස්පර්ශය ලබාදීමෙන් හඬන්නා වූ දරුවා සතුටු කරන හෙයින් මව "තෝසෙන්ති" නමින් හැඳින්වේ.[33] නිසි පරිදි කායික හා මානසික පෝෂණය දරුවනට ලබාදෙන හෙයින්, මව " පෝසෙන්ති" නමින් හැඳින්වේ.[34]

## පූර්වාචාර්ය කෘත්‍යය හා ප්‍රාථමික සමාජානුයෝජනය

සමාජානුයෝජනය පිළිබඳ ක්‍රියාවලියේ ප්‍රාථමික අදියරේදී සිය දරුවා සමාජයට උචිත වූවෙකු ලෙස හදාවඩා ගැනීම දෙමාපිය වගකීමකි. සමාජ ජීවිතය යහපත් ව පවත්වාගෙන යා හැකි පරිදි කුසලතා පූර්ණ පුද්ගලයෙකු සැකසීමට දෙමාපියන් උත්සුක විය යුතු ය. සිය දරුවා විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට යොමුකරලීමට පළමු උචිත අත්දැකීම් ලබාදෙමින් ඔවුන් හදා වැඩිය යුතු ය. මෙම කාර්යය මුල් බුදුසමය විසින් හඳුන්වා දෙන්නේ 'පූර්වාචාර්ය කෘත්‍යය' ලෙසිනි.

ප්‍රාථමික සමාජානුයෝජනයේ දී මවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මුල් බුදුසමය මාතෘත්වය අගයන්නේ මේ නිසා බව පැහැදිලි ය. පෙර දැක්වූ පරිදි මවගේ කාර්යභාරය හඳුන්වාදෙන

ගුණ වාචක නාම කිහිපයක් ජාතක පාළියේ සෝණනන්ද ජාතකයෙහි හමු වේ.[35] ඒ පිළිබඳ ව තව දුරටත් විශ්ලේෂණයක යෙදීම වැදගත් ය.

1. සුහදා
2. ජනෙත්තී
3. තෝසෙන්තී
4. පෝසෙන්තී

සිය දරුවා කෙරෙහි ආදරය, සෙනෙහස දක්වන හෙයින් මව 'සුහදා' නමින් හැඳින් වේ. ආදරය, සෙනෙහස මවක තුළ දරුවා කෙරෙහි ඇතිවන්නේ ගර්භනී සමයෙහි දොළ දුක හටගන්නා අවස්ථාවෙහි සිට ය.[36] දාරක වර්ධනය කෙරෙහි මෙන් ම සිය දරුවාගේ කායික පෝෂණය වර්ධනය කරන අතර ම, ඔවුනට තමා ජීවත්වන පරිසරය, ලෝකය හඳුනා ගැනීමට ඉඩ සලසා දීමක් අවශ්‍යය වේ. මේ අනුව දරුවා යහපත් සමාජ ජීවිතයකට උචිත පරිදි, හැඩගැස්වීමේ ක්‍රියාවලියෙහි මූලික පියවර ගත යුත්තේ දෙමාපියන් විසිනි. ඒ නිසා ම ඔවුන් 'පූර්ව ආචාර්ය' හෙවත් දරුවන්ගේ මුල් ම ගුරුවරයා ලෙස හැඳින්වේ.

මවුපියන් පූර්ව ආචාර්යවරුන් බවට පත්වන්නේ දරුවන්ට ආචාර ධර්ම පුහුණු කරවන මෙන් ම ඔවුන් කැමැති සියල්ල ලබාදෙන හෙයිනි.[37] "මෙසේ කව, මෙසේ හිඳුව" කියා උගන්වන හෙයින් දෙමාපියන් පූර්ව ආචාර්යවරුන් බවට පත් වේ.[38] මෙම සමාජානුයෝජන ක්‍රියාවලිය තවත් තැනෙක විස්තර වන්නේ ද මේ හා සමාන අයුරිනි.[39] "දෙමාපියන් දරුවන් උපත ලද සමයෙහි පටන් මෙසේ හිඳුව, මෙසේ සිටුව, මෙසේ යව, මෙසේ කව, මෙසේ අනුභවකරව" යනුවෙන් ශික්ෂණය කරවයි. මෙම ස්වභාවයෙන් ප්‍රකට වන්නේ දෙමාපියන් විසින් ඉටුකළයුතු ප්‍රාථමික සමාජානුයෝජනමය කාර්යභාරය යි. දරුවාගේ පූර්ණ පෞරුෂ වර්ධනය සඳහා අවශ්‍ය මූලික පියවර සැලසීම මෙම ඉගැන්වීම් ක්‍රියාවලියේ වැදගත් ම ලක්ෂණය වේ.



සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි මූලික අරමුණ වන්නේ, සමාජයට අලුතින් එකතුවන සාමාජිකයා සමාජ හිතකාමියෙකු බවට පත්කරලීම යි. අධ්‍යාපන ක්‍රියාවලියෙහි අරමුණ වන්නේ ද එයයි. මෙලොවට උපන් දරුවා යොමුකළ යුත්තේ උතුම් සමාජයක් වෙත ය. ඒ සඳහා දරුවාගේ ශාරීරික හා මානසික වර්ධනය සැකසීම ද අවශ්‍ය වේ. මිනිස් ජීවිතයේ අරමුණ වන්නේ සුඛ වින්දනය යි. බුදුසමය ගිහි ජනතාවගේ සුඛ වින්දන අභිලාෂය ප්‍රතික්ෂේප නොකරයි. මිනිසත් බවේ සතුට භුක්ති විඳිය හැක්කේ යහපත් ශාරීරික ශක්තියකින් යුතු වූ විට පමණි. සාමාන්‍ය මිනිස් ජීවිතය පවත්වාගෙන යාම සඳහා රාගය වැනි චිත්තවේග බැහැර කළ හැකි නොවේ. සාමාන්‍ය මිනිසා ඉන් තොර වුවහොත් මිනිස් වර්ගයාගේ පැවැත්ම නවතිනු ඇත. එහෙයින් ප්‍රාථමික සමාජානුයෝජනය ක්‍රියාවලිය තුළින් දරුවාගේ කායික හා මානසික ශක්තිය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිසෙකු ලෙස නිර්මාණශීලී ව ප්‍රබෝධවත් සමාජ හිතෛෂී පුද්ගලයෙකු බිහිවන්නේ පූර්වාචාර්ය කෘත්‍යය නිසි ලෙස ඉටුවුවහොත් පමණි. විධිමත් අධ්‍යාපනය කොතරම් හොඳින් ලදත් ඉහත කී පූර්වාචාර්ය කෘත්‍ය නම් වූ මූලික අධ්‍යාපන ක්‍රියාවලිය සිදු නොවුවහොත් සමාජ හිතෛෂී පුද්ගලයෙකු බිහිවන්නේ නොමැත.[40]

සමාජගතවන දරුවාගේ යහපත් හෝ අයහපත් භාවය කෙරෙහි සමාජය ප්‍රබල ලෙස බලපෑම් කරයි. දරුවා ස්වභාවයෙන් ම පිරිසිදු ය. ඔහු සිත, කය, වචනය යන තිදොරින් පව් නො කරයි. ශාරීරික ව නො වැඩුණු දරුවාගේ ක්‍රියාත්මක ස්වභාවය ප්‍රකට වන්නේ සෙලවීමකින් පමණි. ඔහු තුළ පාපී චේතනා නොමැත. වැරැදි දිවි පෙවෙතක් ද නොමැත.[41] මේ අනුව පැහැදිලි වන්නේ ළදරුවාගේ යහපත් බව හෝ අයහපත් බව ඇතිවනුයේ සමාජගතවීමෙන් පසුව බව ය.

එලෙස සමාජගතවන දරුවා යහපත් සමාජානුයෝජනය ක්‍රියාවලියකට යොමුකළ යුතු ආකාරය මුල් බුදුසමයෙහි පිළිබිඹු වේ. ඒ අනුව පූර්වාචාර්ය කාර්යයභාරය මෙසේ පෙළගැස්විය හැකිය.[42]

1. වරදින් වළක්වාලීම (පාපා නිවාරෙන්ති)
2. යහපතෙහි පිහිටුවීම (කල්‍යාණෙ නිවෙසෙන්ති)
3. ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම (සිප්පං සිකඛාපෙන්ති)
4. සුදුසු කල්හි ආවාහ විවාහ කරදීම (පතිරූපෙන දාරෙන සංයොජෙන්ති)
5. සුදුසු කල්හි වස්තුව පවරා දීම (සමයෙ දායජ්ජං නියාාදෙන්ති)

මෙහි පළමු කාර්යන් දෙකින් අදහස් වන්නේ දරුවන් සමාජගත කිරීම හෙවත් සමාජානුයෝජනය කිරීමේ කාර්ය යි. සමාජගතවන දරුවන් තමාට මෙන් ම සමාජයට ද අහිතකර නොවන ලෙස සමාජානුයෝජනය කිරීම දෙමාපියන්ගේ වගකීමකි. සමාජ විරෝධී නොවී ශිෂ්ට ලෙස සදාචාර සම්පන්න ව ජීවත්වීමට හුරුකරවීම මෙහි අරමුණ වේ. සමාජ ජීවිතය යහපත් ව ගෙනයාම සඳහා අවශ්‍ය දැනුම, අවබෝධය හා ආචාර ධර්මීය පුහුණුව ලබාදීම ද සිදුවිය යුතු ය. අනතුරු ව ජීවනෝපාය සඳහා කිසියම් ශිල්පයක් ඉගැන්විය යුතු ය. සමාජයට නව සාමාජිකයන් ප්‍රවේශ කරවීම සඳහාත් මූලික මිනිස් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම් වස් විවාහය සිදුකරලීමත්, ආර්ථිකය ස්ථාවර කරලීමත්, දෙමාපිය වගකීමකි.[43]

## දාරක වර්ධනය හා දෙමාපිය වගකීම

දරුවකු මවුකුස පිළිසිඳ ගැනීමේ පටන් ඔහුගේ ඉන්ද්‍රිය වර්ධනය වී රූපාදී අරමුණු පිළිබඳ යොමුවීම තෙක් දාරක වර්ධනය පිළිබඳ ව මහා තණ්හාසංඛය සූත්‍රයෙහි කරුණු විග්‍රහ වේ.[44] දරුවාගේ ශාරීරික වර්ධනය මෙන් ම ඉන්ද්‍රිය වර්ධනය පිළිබඳ ව ද එහි වෙන් වෙන් ව සඳහන් ව තිබීම විශේෂයකි. ඒ අනුව ශාරීරික වර්ධනය (වුදඩි) යනු කායික වශයෙන් ලබන පෝෂණය යි. ඉන්ද්‍රිය පරිපාකය (ඉන්ද්‍රිය පරිපාක) යනු ඇස, කණ, ආදී ඉන්ද්‍රිය මගින් රූපය ආදී බාහිර අරමුණු දැන ගැනීමෙහි හැකියාව වර්ධනය වීම යි. මෙම වර්ධනයෙන් පසු දරුවා ක්‍රීඩා කරන අවධියට එළඹේ. මෙය කුමාර ක්‍රීඩා අවධිය



නමින් හැඳින්විය හැකිය. ළමයා ස්වභාවයෙන් ම ක්‍රීඩාශීලී අයෙකු ලෙස මුල් බුදුසමය විසින් හඳුනාගෙන තිබීම සුවිශේෂී ලක්ෂණයකි. ළමුන් සඳහා උචිත ක්‍රීඩා සමූහයක් මහා තණ්හාසංඛය සූත්‍රයෙහි සඳහන් වේ.[45]

1. කුඩා නඟුලකින් සෙල්ලම් කිරීම (වංකකං)
2. දිග දණ්ඩකින් කෙටි දණ්ඩකට ගැසීමෙන් කරන ක්‍රීඩාව (ඝටිකං)
3. කරණම් ගැසීම (මොක්ඛචිකං)
4. හුළං පෙත්ත කරකැවීම (චිංගුලකං)
5. නැළියෙන් වැලි මැන සෙල්ලම් කිරීම (පත්තාළ්හකං)
6. කුඩා රථයකින් ගමන් කිරීම (රථකං)
7. දුන්නෙන් විදීම (ධනුකං)

නූතන සමාජවිද්‍යාවේ මෙම සියල්ල ළමා පෞරුෂ වර්ධනයට අවශ්‍ය ලෙස සැලකේ. එහෙත් නූතන සංකල්පයන්ට වඩා බුදුසමයෙහි ප්‍රකට වන මෙවැනි සංකල්පයන්හි ප්‍රායෝගික අදාළත්වය බෙහෙවින් අගය කළ හැකි මට්ටමක පවතින බව සඳහන් කළ යුතුය.

මේ පිළිබඳ ව පුළුල් විග්‍රහයක යෙදෙන විට මෙම ක්‍රීඩාවන්ගේ අදාළත්වය ළමා සංවර්ධනය කෙරෙහි කෙසේ බලපාන්නේදැයි කෙරුණු විග්‍රහයක හරය මෙසේ දැක්විය හැකිය. මෙම ක්‍රීඩාවන් ළමා ශාරීරික හා මානසික වර්ධනය කෙරෙහි බෙහෙවින් ඉවහල් වන බව තහවුරු වේ. කුඩා නඟුලකින් ක්‍රීඩා කිරීම තුළින් සමාජගත කෘෂිකාර්මික ජීවන රටාව පිළිබඳ ව ළමා සිත තුළ ආකල්ප ඇතිකරවීමට පිළිවනි. දිගු දණ්ඩකින් කෙටි දණ්ඩකට ගැසීමේ ක්‍රීඩාව (ඝටිකං) හෙවත්, උඩට විසිකරන කුඩා ලී කැබැල්ල පහතට ඇදී එන විට සුදුසු පරිදි පහර එල්ල කිරීම මගින් චලනය හා ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව, ඇසෙහි සමබරතාව වර්ධනය වේ. ශරීරයේ සමබරතාව හා නම්‍යශීලී ස්වභාවය කරණම් ගැසීම (මොක්ඛචිකං) මගින් වර්ධනය කළ හැකිය. හුළං පෙත්ත කරකැවීම (චිංගුලක) තුළින් ද ළමයා තුළ නිර්මාණ කුසලතාව වර්ධනය වේ. මිනුම් උපකරණයකින් වැලි

බෞද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

මැනීම ගණිතමය කුසලතා වර්ධනයට උපකාරී වේ. කුඩා රථයකින් ක්‍රීඩාවන්හි යෙදීම ළමයා සතු ක්‍රියාශීලීත්වය වැඩි දියුණු වේ. ඇස හා මනස තියුණු කරලීමට දුන්නෙන් විදීමේ ක්‍රීඩාව ද උපයෝගී වන අයුරු[46] එම විග්‍රහයෙන් ප්‍රකට වන වැදගත් සාධකයන් ය. කුඩා ළමුන් සඳහා උචිත මෙම ක්‍රීඩාවන්හි නිරතවීම කෙරෙහි ඔවුන් යොමු කරවීම මනා ඉගෙනුම් ප්‍රවේශයක් බව පැහැදිළි ය.

ශාරීරික හා මානසික වර්ධනය සමාජානුයෝජනය පිළිබඳ ක්‍රියාවලිය හා අත්‍යන්තයෙන් ම බැඳී පවතින්නකි. යහපත් සමාජ ජීවිතයක් සඳහා ශාරීරික හා මානසික කුසලතා වර්ධනය ද අත්‍යවශ්‍ය සාධකයක් බව මේ තුළින් ගම්‍ය වන යථාර්ථය යි.

## මූලික පිළිවෙත් පිළිබඳ සමාජානුයෝජනය

ප්‍රාථමික සමාජානුයෝජනය ක්‍රියාවලියේ දී ළමුනට· මූලික පිළිවෙත්හි පුහුණුව ලබාදීම පූර්වාචාර්යවරුන් වන දෙමාපියන්ගේ වගකීමකි. දරුවන්හට ශාරීරික වතාවත් ආදිය විධිමත්ව හුරුකරවීම, ප්‍රාථමික සමාජානුයෝජනමය ක්‍රියාවලියෙහි විශේෂිත අංගයක් ලෙස වර්තමානයෙහි ද පිළිගන්නා කරුණකි.[47] ආහාර භාවිතය පිළිබඳ පිළිවෙත්, වැසිකිළි භාවිතයෙහි පිළිවෙත්, සෞඛ්‍යය පිළිවෙත් ආදියෙහි හුරුකර වීම මෙහිදී පිළිවෙත් පිළිබඳ සමාජානුයෝජනය යන්නෙන් අදහස් කෙරේ. ඒ තුළ අධ්‍යාපනමය කාර්යයන් හෙවත් ඉගැන්වීමේ ක්‍රියාවලියක් ද සිදු කෙරෙන බව පැහැදිලිය.

මුල් බුදුසමය නවක පැවිද්දන් සමාජානුයෝජනය කිරීම සඳහා භාවිතයට ගතයුතු පිළිවෙත් සමූහයක් ලෙස 'සෙඛියා' නම් වූ ශික්ෂාපද සැත්තෑ පසක් විනය පිටකයෙහි දක්වා තිබේ.[48] භික්ෂු සමූහයාගේ සදාචාර සම්පන්න පැවැත්මට අනුබල දෙන සිරිත් විරිත් සමූහයක් වන සෙඛියා ශික්ෂාපද ශිෂ්ට සම්පන්න මිනිසුන් තුළ පවා පැවතිය යුතු සිරිත් විරිත් සමූහයක් ලෙස අර්ථ සීමනය උචිත ය.[49]



විනය පිටකානුගත මෙම ශික්ෂාවන්හි ප්‍රකට වන සමාජානුයෝජනමය අගය භික්ෂු සමාජය මෙන් ම සමස්ත ගිහි සමාජය ද සමාජානුයෝජනයෙහි බෙහෙවින් ඉවහල්වන හෙයින් මෙහිලා අදාළ කරගැනීම සුදුසු යැයි සිතේ.

ඒ අනුව මුල් බුදුසමය භික්ෂුවකගේ දෛනික ජීවිතයෙහි පැවැත්මට අදාළ ව ආහාර පරිභෝජනය, චීවර පරිහරණය, සිය දායක ගමෙහි දී පිළිපැදිය යුතු පිළිවෙත් ආදිය පිළිබඳ ව මෙම ශික්ෂාපද ආශ්‍රිත ව මාර්ගෝපදේශනය සපයයි. බුදුසමය ආශ්‍රිත ගිහි සමාජයෙහි සමාජානුයෝජනය ක්‍රියාවලිය උදෙසා ද මෙම ශික්ෂාවන්ගේ ආභාසය ලැබී ඇති අයුරු බෞද්ධ ගිහි ජනතාව විසින් අනුගමනය කරන මූලික පිළිවෙත් පිළිබඳ ව විමසා බලනවිට පැහැදිලි වේ. මෙම ශික්ෂාපද සැත්තෑ පසෙන් තිහ (30) ක් ම වෙන් ව ඇත්තේ ආහාර පිළිවෙත් සම්බන්ධයෙන් වීම විශේෂයකි. භික්ෂුව යනු ආදර්ශවත් චරිතයකින් යුත් පුද්ගලයෙකි. ඔහුගේ ආදර්ශය සමස්ත සමාජය වෙත ප්‍රසාරණය වීම නිසා එහි වැදගත්කම තවත් වර්ධනය වේ. පෞද්ගලික හා සමාජගත ජීවිතය ද යහපත් ඇවතුම් පැවතුම් සහිත වීම භික්ෂු ජීවිතයේ ආදර්ශ සම්පන්න භාවය වඩාත් වර්ධනය කරනු ලබන සාධකයකි.

මෙම සෙඛියා ශික්ෂාවන් භික්ෂූන්හට පැනවූ ඒවා නමුත්, එහි ආභාසය ගිහි ජනතාව වෙත ද ලැබී ඇති අයුරු දරුවන් ආහාර ගැනීම පිළිබඳ පිළිවෙත්හි හුරුකරවීම සඳහා දෙමාපියන් විසින් අනුගමනය කරනු ලබන පිළිවෙත්වලින් පැහැදිලි වේ. එවැනි ශික්ෂාපද කිහිපයක් විමසා බැලීමෙන් ගිහි සමාජය වෙත ඉන් ලැබුණු දායකත්වය වටහාගත හැකිය.

1. බත් පතෙහි මුදුනින් ආහාර ගැනීම ආරම්භ නොකළ යුතු ය.
2. වැඩිපුර ආහාර ලබාගැනීම සඳහා ව්‍යංජන ආදිය බත්වලින් නො වැසිය යුතු ය.

3. දොස් දැකීමේ අදහසින් අනුනගේ ආහාර බඳුන් දෙස නො බැලිය යුතු ය.

4. විශාල බත්පිඬු ගෙන අනුභව නොකළ යුතු ය.

5. බත් පිඬු මුවට ළං කිරීමට පෙර මුව විවෘත නො කළ යුතු ය.

6. මුවෙහි ආහාර තබාගෙන කථා නො කළ යුතු ය.

7. බත් පිඬු මුව තුළට විසි නොකරමින් අනුභව නො කළ යුතු ය.

8. ආහාර ගැනීමේ දී අත් ලෙව කෑමෙන් වැළකිය යුතු ය.[50]

ආහාර යනු මිනිසා විසින් නිෂ්පාදිත දෙයකි. ඒ පිළිබඳ පිළිවෙත්හි හැඩගැසීම යනුවෙන් ප්‍රකට වන්නේ සාංස්කෘතික පර්යාය නියෝජනය කිරීමකි. බුදුදහමේ ආභාසය ලත් දෙමාපියන් සිය දරුවනට සියතින් ආහාර ගැනීමේ හැකියාව ලැබූ පසු මෙම පිළිවෙත්හි ඔවුන් අනුයෝජනය කරවීමට උත්සුක වූ බැව් පැහැදිලි ය.

මේ හැරුණු විට ආහාර පිළිවෙත් පිළිබඳ ව සූත්‍ර පිටකාගත දේශනාවන්හි, බොහෝ සාධක හමුවේ. කෙනෙකු දීර්ඝායුෂ්කවීමට නම්, ආහාර පිළිබඳ ව සැලකිලිමත් වියයුතු බවත්, තමන් ආහාර පිණිස ගන්නා දැය පථ්‍යවූවක්වීම, කලින් ගත් ආහාර දිරවීමට පෙර යළි ආහාර නොගැනීම, ආහාරයෙහි පමණ දැනීම, එවැනි මහඟු උපදේශයෝ වෙති.[51] මෙම මහඟු උපදේශ මගින් ප්‍රකට වන්නේ ආහාර පිළිවෙත්හි අනුයෝජනය විය යුතු ආකාරය යි.

ආහාර අනුභව කිරීමේ දී මුලුමනින් ම කුස පිරෙන තුරු ආහාර නොගතයුතු බව (ඌනොදරො) උගන්වන මුල්බුදුසමය පමණ දැන ආහාර ගැනීම (මිතාහාරො) ස්ථූල ශරීරයක් ඇති නොවීමට උපකාරීවන බව අවධාරණය කරයි.[52] ආහාර අනුභව කිරීමේ දී තවත් පිඬු සතරක් හෝ පහක් අනුභව කිරීමට ඉඩ



තිබිය දී, ආහාර ගැනීම අවසන් කොට; ඉතිරි අඩුව සඳහා ජලය පානය කළ යුතු බවත්, එසේ කිරීම ශාරීරික ඉරියව් පහසුවෙන් පවත්වාගෙන යාම සඳහා හේතුභූත වන බවත් සඳහන් කරයි.[53]

මුල් බුදුසමයෙහි සෙඛියා ශික්ෂා ආශ්‍රිත ව මනා කොට ඇඳුම් පැළඳුම් භාවිතය මෙන් ම ඉරියව් පැවැත්වීම් ආදිය පිළිබඳ ව ද කිසියම් ආකාරයක මග පෙන්වීමක් ගිහි සමාජය වෙත ලැබී ඇති බව පැහැදිලි ය. මේ තුළින් විශද වනුයේ ද අධ්‍යාපනමය ක්‍රියාවලියකි.

## ප්‍රාථමික සමාජානුයෝජනය හා පවුල් පරිසරය

සමාජානුයෝජන කාරකයක් වශයෙන් පවුලෙහි ප්‍රබලත්වය ඉමහත් ය. පවුල තුළ පවත්නා ප්‍රසන්න පරිසරය දාරක සමාජානුයෝජනය කෙරෙහි යහපත් උත්තේජනයක් වන බව පැහැදිලි සත්‍යයකි. පවුලක අඹු සැමි සබඳතාව අයහපත් වූවක් වන්නේ නම්, එම පවුලෙහි දරුවන් යහපත් සමාජානුයෝජනයක් ලබන්නේ නොමැත. දරුවන් විසින් දෙමාපියෝ අනුකරණය කෙරෙති. එනිසා දෙමාපියන් යහපත් ආදර්ශයක් දරුවනට සැපයීම අත්‍යවශ්‍ය වේ. දෙමාපියන් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රියශීලී ඇවතුම් පැවතුම් සහිතවීම නිවසෙහි පරිසරය ප්‍රසන්න වූවක් බවට පත්කරවයි. එවන් පරිසරයක් දරුවනට මහඟු උත්තේජකයක් වශයෙන් මහත් වූ බලපෑමක් කරන බව නිසැකය. සිය දෙමාපියන් මහත්වූ සෙනෙහසින් හා අන්‍යෝන්‍ය ආදර ගෞරවයෙන් යුතුව සිය පවුල් ජීවිතය ගත කිරීම අත්දකින දරුවෝ මහත්වූ සතුටින් ප්‍රීතියෙන් සිය ජීවන අත්දැකීම් ලබති. ඒ අනුව අඹුසැමි යුවල ප්‍රියශීලි තෙපුල් (පියංවදා) සහිත විය යුතුය. ළමා ස්වභාවය වන්නේ ඔවුන් අත්දකින දේ අසනා දේ එලෙසින්ම අනුකරණය කිරීමයි. එහෙයින් දෙමව්පියන් ප්‍රියශීලි තෙපුල් සහිතව ප්‍රසන්න ලෙස කථාවෙහි නිරත වීම දරුවනට මහඟු ආදර්ශයකි. මවුපිය දෙපළ ආගමික වශයෙන් යහපත් වූ ඇවතුම් පැවතුම් සහිත වූවන් වීමද ඔවුනගේ පවුල් පරිසරය යහපත් බවට පත් කරවයි. එවැනි පවුල් පරිසරයක් දරුවනට

අගනා සමාජානුයෝජනමය ආදර්ශයක් වනු ඇත. එසේම එකිනෙකා විසින් සිය දිවි පැවැත්මේදී වැදගත් වන සන්නිවේදන චර්යා (වදඤ්ඤූ) මනාව පවත්වා ගැනීම වැදගත් වේ. සදාචාර සම්පන්න වූ දිවි පැවැත්මක් සහිත වීම (ධම්මජීවිනො) මෙන්ම සමාන වූ යහපත් චර්යා සහිත වීම (සමසීලිනො) ආදර්ශවත් පවුල් පරිසරයක සලකුණු වේ.[54] පෙර සඳහන් කළ අන්දමේ ආදර්ශවත් විවාහ ජීවිතයක් ගතකළ නකුල මාතා - නකුල පිතා යුවළගේ විවාහ ජීවිතය මෙබඳු ගුණ ධර්මයන්ගෙන් පෝෂණය වූවකි. විවාහක යුවළක් එකිනෙකා නොඉක්මවන හැසිරීම් සහිත වියයුතු බව නකුල මාතා - නකුල පිතා ආදර්ශය ප්‍රකට කරයි. ඔවුන් දෙදෙනා කොපමණ බැඳීමකින් යුතු ව ජීවත් වූවා ද කියතොත්, මෙලොව දී මෙන් ම පරලොවදීත් එකිනෙකා දකිනු රිසියෙන් ජීවත් වූහ.[55] සැබෑ විවාහ ජීවිතයක් සහිත පවුල් පරිසරයක ස්වභාවය මෙබඳු ය.

දාරක සමාජානුයෝජනය සඳහා උචිත පරිසරයක් සහිත, පවුලක පරදාර සේවනය සඳහා ඉඩක් නොමැත. පරදාර සේවනයෙහි යෙදෙන්නවුනට, තමන් සිදුකරන අයහපත් චර්යාවන්හි ප්‍රති විපාක විඳීමට සිදුවේ (අපුඤ්ඤලාභො). පහත් ස්වභාව සහිත වේ (ගතී ච පාපිකා), පරදාර සේවනයෙහි යෙදෙනුයේ රහසිගත ව ය, බියෙන් යුතු ව ය. ඒ නිසා ලබන ආශ්වාදය ද අඩුවේ (භීතස්ස භීතාය රතී ච ථොකිකා), නීතිය හමුවේ දඬුවම් ලැබීමට ද සිදුවේ (රාජා ච දණ්ඩං ගරුකං පණෙති).[56] යහපත් යුග දිවියක මිහිර විඳිය හැක්කේ මෙබඳු විෂමාචාරයන්ගෙන් දුරුවූ විට පමණි. දෙමාපියන් මෙවැනි විෂමාචාර සහිත වන්නේ නම් දරුවන්ට තිසි මග පෙන්වීමේ වගකීමෙහි අවනතියක් ඇතිවනු නියත ය. සැබෑ සමාජානුයෝජනයට අවශ්‍ය පරිසරය ඒ තුළ ජනිත නොවනු ඇත.

දෙමාපියන් ඔවුනොවුන් එකිනෙකා නුරුස්සන සුළු අය වන විට, එවැනි පවුල් පරිසරයක දරුවෝ සැබෑ මව්පිය සෙනෙහසක් නොලබති. ඔවුන් ලබනුයේ අයහපත් සමාජානුයෝජනයක පහස පමණි. සමාජගත සම්මතයට පිටුපා ක්‍රියාකරන ඔවුහු අයහපත් ගති ස්වභාව ප්‍රකට කරති. එනිසා යුග දිවියේ සැබෑ අර්ථය වටහාගෙන කටයුතු කිරීම යහපත් සමාජානුයෝජනයක් සඳහා උපකාරී පරිසරයක් නිර්මාණය කරයි.



දරුවාට ආරක්ෂාව සලසන හොඳ ම ස්ථානය වන්නේ පවුල් පරිසරය යි. එම සුරක්ෂිත පරිසරය පිළිබඳ විශ්වාසය, ඔවුන් ලබන සමාජානුයෝජනය වඩාත් යහපත් වූවක් බවට පත්කරවීමට උපස්ථම්භක වේ. දරුවා තම ආරක්ෂාව සලසා ගැනීමට නොදන්නා හෙයින්; දරුවනට තමා ම රැකෙන්නට හැකියාව ලැබෙනතුරු ආරක්ෂා කිරීම දෙමාපිය වගකීමෙකි. පූර්ව දේවතාවන් ලෙස මෙම වගකීම දෙමාපියන් විසින් ඉටුකළ යුතු වේ. මෙයින් ගම්‍ය වන සුවිශේෂී අර්ථය වන්නේ, දරුවනට තමා ම රැකිය යුතු අයුරු පුරුදු පුහුණු කළ යුත්තේ ද පූර්වාචාර්යවරුන් වන දෙමාපියන් විසින් බව ය.[57] මෙම කාර්යය සමාජානුයෝජනය හා අදාළ වූවකි. කිසියම් උවදුරක් පිළිබඳ ව දරුවාට වැටහීමක් නොමැති හෙයින් එවැනි අවස්ථාවක පිළිපැදිය යුතු ආකාරය මුල්බුදුසමයෙහි සඳහන් වේ.[58] කුඩා දරුවෙක් මවගේ ප්‍රමාදයක් ඇති කල්හි, කිසියම් ලී කැබැල්ලක් හෝ කැබැලිත්තක් මුවෙහි රඳවා ගනියි. මවද වහා එය ඉවත් කිරීමට උත්සුක වේ. කෙසේ හෝ දරුවාට වේදනා දෙවමින් හෝ එය ඉවත් කරයි. එසේ කරනුයේ දරුවා කෙරෙහි වන අප්‍රමාණ අනුකම්පාව නිසා ය.[59]

සමාලෝචනය :- ළදරුවකු වශයෙන් ලොවට බිහිවන දරුවා යහපත් සමාජානුයෝජනය ක්‍රියාවලියකට ප්‍රවේශ කරවනුයේ පූර්වාචාර්ය හෙවත් දෙමාපියන් විසිනි. ඕනෑ ම ක්‍රියාවලියකට ප්‍රබල පදනමක් වනුයේ එම ක්‍රියාවලියෙහි ආරම්භය යි. ඒ අනුව මානවීය සමාජානුයෝජනය ක්‍රියාවලියේ ආරම්භය වන පවුල් ඒකකය යථා පරිදි සංවිධානය වීම අත්‍යවශ්‍යය වේ. බෞද්ධ සමාජානුයෝජනය සංකල්පයෙහි, ආසන්නතම අරමුණ වනුයේ

පුද්ගලයාගේ සමාජගත ජීවිතය ප්‍රසන්න බවට පත්කරලීම මගින් වඩාත් යහපත් සමාජානුයෝජනය ක්‍රියාවලියකට මං පෙත් හෙළි කිරීම ය. ඒ සඳහා මූලික ම කාර්යභාරය ඉටුකරනුයේ පවුල විසින් බව පැහැදිලිය. ඒ අනුව නූතන සමාජ විද්‍යාඥයන් මෙන්ම දරුවන් සමාජගත කිරීමෙහි ක්‍රියාවලියෙහි නියුක්ත වන දෙමාපියන්ද මෙමගින් අනාවරණය කෙරෙන සාධක පිළිබඳව අවධානය යොමු කිරීම බෙහෙවින් ඵලදායි වන බව පැවසිය හැකිය.

## ආන්තික සටහන්

[1] හේරත්; එච්.එම්.ඩී.ආර්. ඥාතිත්වය; කර්තෘ ප්‍රකාශන; තරංජි ප්‍රින්ටර්ස්; මහරගම; 1999 පිටුව 20

[2] I Devids, Stede; Pali - English Dictionary; Motial Banarsidass Publishers; Delhi; India; 1993; P.222.

ii බුද්ධදත්ත, පොල්වත්තේ, පාලි - සිංහල අකාරාදිය, ගුණසේන, කොළඹ, 1950, පි. 163.

❖ වර්තමානයෙහි පවා සිංහල ව්‍යවහාරයෙහි විවාහ වීම යන්න හැඳින්වීම සඳහා ''කුල ගෙට යාම'' යනුවෙන් ව්‍යවහාර වීමෙන් පැහැදිලි වන්නේ ''කුල'' යන පදය විවාහයෙන් අර්ථවත් වන ''පවුල'' හැඳින්වීම සඳහා භාවිතා වන බව ය.

[3] සබ්‍රහ්මකානි භික්ඛවෙ තානිකුලානි යෙසං පිතුන්නං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති; සපුබ්බාචරියකානි භික්ඛවෙ තානිකුලානි යෙසං පුත්තානං අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, සපුබ්බදෙවතානි භික්ඛවෙ තානිකුලානි යෙසං..... අ.නි. 2;

[4] බ්‍රහ්මාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; -එම-

[5] අරියවිමල; කොස්වත්තේ; බුදුනු දිවිය; තරුණ ශීල සමාදාන ප්‍රකාශන; වජිරඥාණ ධර්මායතනය; මහරගම; 1999; පිටුව 42.

[6] පුබ්බාචරියකාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; අ.නි. 2; සබ්‍රහ්ම සුත්තං; පිටුව 132.

[7] පුබ්බදෙවාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; - එම -



[8] අථ බො තෙ වාසෙට්ඨා සත්තා රසං පඨවිං හත්ථෙහි ආලුප්පකාරකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං -එම- පිටුව 146.

[9] Leakey, Richard E; Origins, Macdonald' & Jane's, London; 1979; p. 05.

[10] අථ බො තෙ වාසෙට්ඨා සත්තා භූමිප්පපටකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං; දී. නි. 3; අග්ගඤ්ඤ සුත්තං; පිටුව 148.

[11] අථ බො තෙ වාසෙට්ඨා සත්තා බදාලතං උපක්කමිංසු පරිභුඤ්ජිතුං; -එම-

[12] තත්‍ථ යෙ තෙ සත්තා වණ්ණවන්තො, තෙ දුබ්බණ්ණෙ සත්තෙ අතිමඤ්ඤන්ති මයමෙතෙහි වණ්ණවන්තතරා අමෙහ තෙ දුබ්බණ්ණතන්ති, තෙසං වණ්ණාති මානප්පච්චයා මානාතිමානජාතිකානං - එම -

[13] අථ බො වාසෙට්ඨා සත්තා ලොල ජාතිකො අමෙහා කිමෙවිදං භවිස්සතීති රසං පඨවිං අංගුලියා සායි. තස්ස රසං පඨවිං අංගුලියා සායතො අච්ඡාදෙසි. තණ්හා චස්ස ඔක්කමි..... තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානා රසං පඨවිං අංගුලියා සායි; -එම- පිටුව 144.

[14] ....... න ඉත්‍ථිපුමා පඤ්ඤයන්ති, සත්තා සත්තාත්වෙව සංඛං ගච්ඡන්ති; -එම-

[15] ඉත්‍ථියා ඉත්‍ථිලිංගා පාතුරහොසි, පුරිසස්ස ච පුරිසලිංගං, ඉත්‍ථිච සුදං පුරිසං අතිවෙලං උපනිජ්ඣායති අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායකං සාරාගො උප්පාදි. පරිළාහො කායස්ස ඔක්කමි තෙ පරිළාහ පච්චයා මෙථුන ධම්මං පටිසෙවිංසු; -එම- පිටුව 150.

[16] Swaris, N; The Buddha's way to Human Liberation" A socio - Historical Approach; Sridevi Printers, Dehiwala, 1999; p. 313.

[17] Foucault, The History of Sexuality; vol. 3; Penguin Books; 1986: p. 157.

[18] කතමහි නාම සත්තා සත්තස්ස එවරූපං කරිස්සති; දී. නි. 3; අග්ගඤ්ඤ සුත්තං; පිටුව 150.

[19] අසද්ධම්මෙ අතිවෙලං පාතබ්‍යතං ආප්පජිංසු; අථ තෙ අගාරානි උපක්කමිංසු; -එම-

[20] හේරත්; එච්. එම්. ඩී. ආර්. ප්‍රබුද්ධ 2; ස්වාභාවික පර්යාය; සංස්කෘතික පර්යාය හා පංච ශීලය; 2000; පිටුව 251.

[21] Murdock; G.P.Social Structure; Macmillan Ltd; New York,

[22] බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පෝසකා ඉමස්ස ලොකස්ස දසෙසතාරො; අ.නි. 2; සබ්‍රහ්ම සුත්තං; පිටුව 132.

[23] ආපාදකාති වඩ්ඪකා අනුපාලකා, පුත්තාහි මාතාපිතුහි වඩ්ඪිතා චෙව අනුපාලිතා ච; අ.නි. අ. හේ. මු. 1923; පිටුව 312.

පුද්ගලයාගේ සමාජගත ජීවිතය ප්‍රසන්න බවට පත්කරලීම මගින් වඩාත් යහපත් සමාජානුයෝජනය ක්‍රියාවලියකට මං පෙත් හෙළි කිරීම ය. ඒ සඳහා මූලික ම කාර්යභාරය ඉටුකරනුයේ පවුල විසින් බව පැහැදිලිය. ඒ අනුව නූතන සමාජ විද්‍යාඥයන් මෙන්ම දරුවන් සමාජගත කිරීමෙහි ක්‍රියාවලියෙහි නියුක්ත වන දෙමාපියන්ද මෙමගින් අනාවරණය කෙරෙන සාධක පිළිබඳව අවධානය යොමු කිරීම බෙහෙවින් ඵලදායි වන බව පැවසිය හැකිය.

## ආන්තික සටහන්

[1] හේරත්; එච්.එම්.ඩී.ආර්. ඥාතිත්වය; කර්තෘ ප්‍රකාශන; තරංජි ප්‍රින්ටර්ස්; මහරගම; 1999 පිටුව 20

[2] I Devids, Stede; Pali - English Dictionary; Motial Banarsidass Publishers; Delhi; India; 1993; P.222.

ii බුද්ධදත්ත, පොල්වත්තේ, පාලි - සිංහල අකාරාදිය, ගුණසේන, කොළඹ, 1950, පි. 163.

❖ වර්තමානයෙහි පවා සිංහල ව්‍යවහාරයෙහි විවාහ වීම යන්න හැඳින්වීම සඳහා ''කුල ගෙට යාම'' යනුවෙන් ව්‍යවහාර වීමෙන් පැහැදිලි වන්නේ ''කුල'' යන පදය විවාහයෙන් අර්ථවත් වන ''පවුල'' හැඳින්වීම සඳහා භාවිතා වන බව ය.

[3] සබ්‍රහ්මකානි භික්ඛවෙ තානිකුලානි යෙසං පිතුන්නං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති; සපුබ්බාචරියකානි භික්ඛවෙ තානිකුලානි යෙසං පුත්තානං අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, සපුබ්බදෙවතානි භික්ඛවෙ තානිකුලානි යෙසං..... අ.නි. 2;

[4] බ්‍රහ්මාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; -එම-

[5] අරියවිමල; කොස්වත්තේ; බුදුනු දිවිය; තරුණ ශීල සමාදාන ප්‍රකාශන; වජිරඤාණ ධර්මායතනය; මහරගම; 1999; පිටුව 42.

[6] පුබ්බාචරියකාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; අ.නි. 2; සබ්‍රහ්ම සුත්තං; පිටුව 132.

[7] පුබ්බදෙවාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං; - එම -



[8] අථ බො තෙ වාසෙට්ඨා සත්තා රසං පඨවිං හත්ථෙහි ආලුප්පකරකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං -එම- පිටුව 146.

[9] Leakey, Richard E; Origins, Macdonald' & Jane's, London; 1979; p. 05.

[10] අථ බො තෙ වාසෙට්ඨා සත්තා භූමිප්පපටකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං; දී. නි. 3; අග්ගඤ්ඤ සුතතං; පිටුව 148.

[11] අථ බො තෙ වාසෙට්ඨා සත්තා බදාලතං උපක්කමිංසු පරිභුඤ්ජිතුං; -එම-

[12] තත්‍ර යෙ තෙ සත්තා වණ්ණවනෙතා, තෙ දුබ්බණෙණ සතෙත අතිමඤ්ඤන්ති මයමෙතෙහි වණ්ණවන්තතරා අමෙහ තෙ දුබබණහන්ති, තෙසං වණ්ණාති මානප්පච්චයා මානාතිමානජාතිකානං - එම -

[13] අථ බො වාසෙට්ඨා සත්තා ලොල ජාතිකො අමෙහා කිමෙවිදං භවිස්සතීති රසං පඨවිං අංගුලියා සායි. තස්ස රසං පඨවිං අංගුලියා සායතො අචඡාදෙසි. තණ්හා චස්ස ඔක්කමි..... තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානා රසං පඨවිං අංගුලියා සායි; -එම- පිටුව 144.

[14] ....... න ඉත්ථිපුමා පඤ්ඤයන්ති, සත්තා සත්තාතෙව සංඛං ගචඡන්ති; -එම-

[15] ඉත්ථියා ඉත්ථිලිංගා පාතුරහොසි, පුරිසස්ස ච පුරිසලිංගං, ඉත්ථිච සුදං පුරිසං අතිවෙලං උපනිජ්ඣායති අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායතං සාරාගො උප්පාදි. පරිළාහො කායස්ස ඔක්කමි තෙ පරිළාහ පච්චයා මෙථුන ධම්මං පටිසෙවිංසු; -එම- පිටුව 150.

[16] Swaris, N; The Buddha's way to Human Liberation" A socio - Historical Approach; Sridevi Printers, Dehiwala, 1999; p. 313.

[17] Foucault, The History of Sexuality; vol. 3; Penguin Books; 1986: p. 157.

[18] කතමහි නාම සත්තා සත්තස්ස එවරූපං කරිස්සති; දී. නි. 3; අග්ගඤ්ඤ සුත්තං; පිටුව 150.

[19] අසද්ධමෙම අතිවෙලං පාතබ්‍යතං ආප්පජිංසු; අථ තෙ අගාරානි උපක්කමිංසු; -එම-

[20] හේරත්; එච්. එම්. ඩී. ආර්. ප්‍රබුද්ධ 2; ස්වාභාවික පර්යාය; සංස්කෘතික පර්යාය හා පංච ශීලය; 2000; පිටුව 251.

[21] Murdock; G.P.Social Structure; Macmillan Ltd; New York,

[22] බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පෝසකා ඉමස්ස ලොකස්ස දසෙසතාරො; අ.නි. 2; සබ්‍රහ්ම සුත්තං; පිටුව 132.

[23] ආපාදකාති වඩ්ඪකා අනුපාලකා, පුත්තාහි මාතාපිතූහි වඩ්ඪිතා චෙව අනුපාලිතා ච; අ.නි. අ. හේ. මු. 1923; පිටුව 312.

[24] අරියවිමල; කොස්වත්තේ; බෞද්ධ ළදරු අධ්‍යාපන දර්ශනය; ජාතික ළමා අධ්‍යාපන පදනම, මුල්ලේරියාව, 1990; පිටුව 12.

[25] යතො ච බො සො භික්ඛවෙ කුමාරො වුදෙධා හොති; අලං පඤ්ඤා අනපෙක්ඛා පන භික්ඛවෙ ධාති තස්මිං කුමාරෙ හොති. අත්ත ගුතෙතාදානි කුමාරො නාලං පමාදායති අ.නි. 3; කාමෙසු පළාලිත සුත්තං; පිටුව 10.

[26] තමෙනං භික්ඛවෙ මාතා නවන්නං වා දසන්නං වා මාසානං අච්චයෙන විජායති, මහතා සංසයෙන ගරු ගමභාරං, තමෙනං ජාතං සමානං සකෙන ලොහිතෙන පොසෙති. ලොහිතං හෙතං භිකඛවෙ අරියස්ස විනයෙ යදිදං මාතුථඤ්ඤං - එම-

[27] බුද්ධදත්ත හිමි; පාලි සිංහල අකාරාදිය ; 1989, පිටුව 99.

[28] ම.නි 1; සම්මා දිට්ඨි සුතතං; පිටුව 10.

[29] සබො සො භික්ඛවෙ කුමාරො වුදධිමන්වාය පරිපාකමන්වාය පඤ්ච හි කාමගුණෙ සමප්පිතො සමංගිභූතො පරිචාරෙති - එම - පිටුව 624

[30] ඉමසස ලොකස්ස දසෙසතාරොති සචෙහි මාතා පිතරො ජාත දිවසෙ යෙව පුත්තං පාදෙ ගහෙත්වා අරඤ්ඤෙ වා නදියං වා පපාතෙ වා ඛිපෙයුං ඉමස්මිං ලොකෙ ඉට්ඨානිට්ඨාරම්මණං මාතා පිතරො නිස්සාය පස්සතීති ත්‍යාස්ස ඉමස්ස ලොකස්ස දසෙසතාරො නාම හොන්ති; අ.නි.අ. හේ, මු. 1923; පිටුව 312.

[31] අරියවිමල; කොස්වත්තේ, බුදුනු දිවිය; මහරගම; වජිරඤාණ ධර්මායතන ප්‍රකාශනයකි; 1999; පිටුව 46.

[32] සංවච්ඡරං වා ඌනං වා පරිහරිත්වා විජායති තෙන සා ජනයන්තීති - ජනෙත්ති තෙන වුච්චති. ජාතක පාළි II, සොණනන්ද ජාතකං; ගාථාව 3808; පිටුව 318.

[33] ථන ඛීරෙන ගීතෙන අංග පාපුරණෙන ච රොදන්තං පුත්තං තොසෙති - තොසෙන්ති තෙන වුච්චති; - එම - ගාථාව 3809.

[34] තතො වාතාතපෙ ඝොරෙ - මමං කත්වා උදික්ඛතිදාරකා අප්පජානන්තං - පොසෙන්ති තෙන වුචචති; - එම - ගාථාව 3810.

[35] ජාතක පාළි II; සොණනන්ද ජාතකය; පිටුව 317 - 318.

[36] තස්සා උතුසිනාතාය - හොති ගබහස්ස වක්කමොතෙන දොහළිනී හොති - සුහදා තෙන වුච්චති. ජාතක පාළි II; සොණනන්ද ජාතකං; ගාථාව 3807. පිටුව 317.

[37] ආචරිය මනු සත්ථාරං - සබ්බකාම රසාරහං. ජාතක පාළි I, ජනසන්ධ ජාතකං; ගාථාව 1706; පිටුව 424.

[38] ජනසන්ධ ජාතකය; පන්සිය පණස් ජාතක පොත; බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය; 2000; පිටුව 944.



[39] පුබ්බාචරියාති ජාත වුච්චරෙති මාතාපිතරො හි ජාත කාලතො පට්ඨාය එවං නිසීද; එවං තිට්ඨ; එවං ගච්ඡ, එවං සය; එවං ඛාද, එවං භුජ,...... අ.නි.අ. I, හේ.මු. 1923; පිටුව 361.

[40] අරියවිමල; කොස්වත්තේ, බෞද්ධ ළදරු අධ්‍යාපන දර්ශනය; ජාතික ළමා අධ්‍යාපන පදනම; 1990; පිටුව 14.

[41] දහරසෙසහි ථපති, කුමාරස්ස මන්‍දස්ස උත්තාන සෙය්‍යකස්ස කායොතිපි න හොති; කුතො පන කායෙන පාපකං කමමං කරිස්සති. අඤ්ඤත්‍ර එන්දිතමත්තා ........ කුතො පන පාපකං ආජීවං ආජිවිස්සති, අඤ්ඤත්‍ර; ම.නි.2, සමණමණ්ඩිකා සුතතං; පිටුව 368.

[42] ඉමෙහි බො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුතෙතන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති, පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති සිප්පං සිකඛාපෙන්ති, පතිරූපෙන දාරෙන සංයොජෙන්ති සමයෙ දායජ්ජං නිය්‍යාදෙන්ති; දී. නි. 3; සිගාලක සුත්තං; පිටුව 304.

[43] හෙට්ටිආරච්චි, ධර්මසේන; බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය; ගොඩගේ ප්‍රකාශකයෝ, 2001; පිටුව 69.

[44] ම.නි.; මහා තණහාසංඛය සුත්තං; පිටුව 602.

[45] ස බො සො භිකඛවෙ කුමාරො වුදධිමන්වාය ඉන්ද්‍රියානං පරිපාක මන්වාය යානි තානි කුමාරකානං කීළාපනකානි තෙහි කීළති; සෙය්‍යථීදං, වංකකං ඝටිකං මොක්ඛචිකං චිංගුලකං පත්තාළහකං රථකං ධනුකං; - එම - පිටුව 624.

[46] අරියවිමල, කොස්වත්තේ; බෞද්ධ ළදරු අධ්‍යාපන දර්ශනය; ජාතික ළමා අධ්‍යාපන පදනම; 1990; පිටුව 16.

[47] Bowerman; E.C. The American Sociological Review; Vol. 28; PP 891 - 905.

[48] පාචිත්තිය පාළි, භික්ඛු විභංග; පිටු 488 සිට ඉදිරියට.

සෙඛියා ශික්ෂාපද - භික්ෂූන් සිවුරු හැඳ පෙරවිය යුතු අයුරු, දන් වැළඳිය යුතු අයුරු; ගමෙහි හැසිරිය යුතු අයුරු ආදිය පිළිබඳ මග පෙන්වනු ලබන ශික්ෂාපද සැත්තෑ පසකි.

[49] ධම්මපරායන තිස්ස; බුජ්ජම්පොළ; ප්‍රාතිමෝක්ෂ විවරණය; රත්න පොත් ප්‍රකාශකයෝ; මරදාන, 1971; පිටුව 425.

[50] පාචිත්තියපාළි; භික්ඛු විභංග; පිටුව 514 සිට.

[51] සප්පායකාරී හොති, සප්පායෙ මත්තං ජානාති; පරිමිතභොජී ච හොති; අ.නි. 3; පඨම අනායුස්ස සුත්තං; පිටුව 236.

[52] අල්ලං සුක්ඛං වා භුඤ්ජනෙතා න බාළ්හං සුහිතො සියා ඌනොදරො මිතාහාරොසතො භික්ඛු පරිබ්බජෙ, ථෙරගාථා; සාරිපුත්ත ථෙරගාථා; ගාථාව 982; පිටුව 228.

[53] චත්තාරො පංච ආලොපෙ - අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය - පහිතත්තස්ස භික්ඛුනො; - එම - ගාථාව 983; පිටුව 228.

[54] අං.නි. පඨම සංවාස සුත්තං, පිටුව 118.

[55] ඉචෙජයාම මයං භනෙත දිට්ඨෙව චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සන්ති; අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සන්තීති; අ.නි.2; පඨම සංවාස සුත්තං; පිටුව 118

[56] අපුඤ්ඤ ලාභො ච ගතී ච පාපිකා - භීතස්ස භීතාය රතී ච ථොකිකා
රාජා ච දණ්ඩං ගරුකං පණෙති - තසමා නරො පරදාරං න සෙවෙ;
ඛු. නි. ධම්මපදපාළි ගාථාව 310; නිරය වග්ග - ගාථාව 5, පිටුව 102

[57] අරියවිමල; කොස්වත්තේ, බෞද්ධ ළදරු අධ්‍යාපන දර්ශනය; ජාතික ළමා අධ්‍යාපන පදනම; 1990; පිටුව 44.

[58] අ.නි. 3; කාමෙසු පලාළිත සුත්තං; පිටුව 10.

[59] සෙය්‍යථාපි භික්ඛවෙ දහරො කුමාරො මන්‍දො උත්තානසෙය්‍යකො ධාතියා පමාදමන්‍වාය කට්ඨං වා කඨලං වා මුඛෙ ආහරෙය්‍ය......... අත්ථකාමාය හිතෙසිනියා අනුකම්පිකාය අනුකම්පං උපාදාය - එම -